මන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
--------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්‍ෂණ සිදු කෙරේ.

(අ) රජය සහ රාජ්‍ය නොවන සංවිධාන නමින් පරිත්‍යාග කරන ලද අයිතම 56 ක වටිනාකම පසුගිය වසර 04 ක් පුරාම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් දේපළ 09 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) එකතුව රු. 30,000 ක් වු වර්ෂ 2010 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් අයකර කටයුතු මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවට ගෙන නොතිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදල අඩුවෙන් දැක්විණි.

1.3.3 ලැබිය යුතු මුදල්
------------------

වසරකට වැඩි කාලයක පටන් ලැබිය යුතුව පවතින, එකතුව රු. 6,903,369 ක්වු , ලැබිය යුතු ආදායම් වර්ග 6 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අවස්ථා නිරීක්‍ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) | පරිච්ඡේදය iii රීති - 24 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග හා වීථි පිළිබඳ විස්තර එය ස්ථාපිත කර වසර තුනක් ඇතුළත ප්‍රසිද්ධ කළ යුතු වුවද, එම විස්තර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ii) | පරිච්ඡේදය iii රීති - 33 | සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි. |
| (iii) | පරිච්ඡේදය v රීති - 140 | එකතුව රු. 1,925 ක්වූ නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) | පරිච්ඡේදය ix රීති - 180 | මුදල් හා ගබඩා කටයුතු භාර නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතබුණි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | |
| (i) | වගන්ති 5.4.12 | එකතු කළ අගය මත වූ බදු ආවරණය සඳහා ගෙවීම් කිරීමෙන් අනතුරුව, එම ගෙවීම් පිළිබඳ විස්තර පසුව එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා යවා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 11,436,675 ක මුදල ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම වූ රු. 11,825,705 ක මුදල හා සැසඳූ විට සමාලෝචිත වර්ෂයේ වියදම ඉක්මවූ ආදායමේ රු. 389,030 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ. සභාවේ පුනරාවර්ථන වියදම් ගෙවීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් මෙම පිරිහීමට හේතු විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය වූ රු.55,386 ක ශුද්ධ අතිරික්තය ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපී අතිරික්තය වූ රු. 547,824 හා සැසඳූ විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 492,438 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.3. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වු සභාවේ කාරක ප්‍රාග්ධනය වු රු.28,097,498 ක මුදල, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වු රු. 19,691,486 ක මුදල හා සැසඳු විට, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 8,406,012 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් කළමනාකරණය

----------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වු ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු සභාව විසින් ඉදිරිපත් කරන ලද පරිදි පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත මුදල | තත්‍ය මුදල | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - |
| කුලී හා බදු කුලී | 619 | 686 | 233 |
| බලපත්‍ර ගාස්තු | 176 | 366 | - |
| අනෙකුත් ආදායම් | 6,580 | 14,376 | 5,672 |
| | 7,377 | 15,428 | 5,905 |

2.4.2 වරිපනම් හා බදු

----------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 32 වගන්තිය ප්‍රකාරව වරිපනම් හා බදු සඳහා ලේඛනය පවත්වා නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

සභා සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන්, සංවර්ධන කටයුතු සඳහා බලපා ඇති බැව් පෙන්නුම් කෙරිණි.

3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව වාර්ෂික ගබඩා සමීක්ෂණය පිළිබඳව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ යුතුව තිබු වාර්තාව විගණනය ලබානොදුණි.

3.3 අත්හැර දැමු ව්‍යාපෘති

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු. 30,500,000 කට ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන ව්‍යාපෘති 03 අත්හැර දමා තිබු අතර එයට තුඩුදුන් හේතු විගණනයට ලබාගත නොහැකි විය

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

ඵලදායි යන්ත්‍රයක් ලෙස යොදා ගනු වස් අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර රු. 47,470 සිට රු.1,355,197 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 රජෙය් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහෙය් 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වු ප්‍රසම්පාදන කාල සටහන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

---------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට හෝ සමාලෝචිත වර්ෂය සඳහා වු සභා කටයුතු ඵලදායීව විගණනය මඟින් පරීක්ෂා කිරීම සඳහා ක්‍රියාකර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

-------------------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තෙමන්තුවේ අංක ඩීඑම්ජී/2009/(1) හා 2009 ජුනි 09 දිනැති චක්‍රලේඛයට අනුකූලව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත් විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

I. ආදායම් රැස්කිරීම
II. ස්ථාවර වත්කම්
III. ගිණුම්කරණය
IV. සේවක සංඛ්‍යාව
V. වාහන උපයෝජනය
VI. අයවැය පාලනය
VII. ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය